# විශේෂ නිවේදනයයි.

**ඊශ්‍රායලයේ වාසය කරන සියළුම ශ්‍රී ලාංකිකයන් වෙත,**

**<u>රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණ කට්ටල ( Rapid Antigen Test Kits) පරිත්‍යාග කිරීම</u>**

ශ්‍රී ලංකාව තුළ COVID -19 වෛරසයේ OMICRON ප්‍රභේදය පැතිරීම පාලනය කිරීමේදී ආසාදිතයින් හඳුනාගැනීම සඳහා අවශ්‍ය වන රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණ කට්ටල ( Rapid Antigen Test Kits) රජයේ රෝහල් සඳහා කඩිනමින් අවශ්‍ය වී ඇති බව ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය විසින් දන්වා ඇත.

ඒ අනුව ඔබ විසින් රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණ කට්ටල පරිත්‍යාග කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ පිළිබඳ විස්තර ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පූර්ව අනුමැතිය ලබාගැනීම සඳහා මෙම තානාපති කාර්යාලය හරහා විදේශ අමාතයයාංශයේ COVID -19 අංශයට යැවිය යුතු අතර එම පරීක්ෂණ කට්ටල ශ්‍රී ලංකාවට ප්‍රවාහනය කිරීමේදී ඒ සඳහා වැයවන ගුවන් ප්‍රවාහන ගාස්තු සහ ඊශ්‍රායලයේ ගුවන් තොටුපළ ගාස්තු ද පරිත්‍යාගශීලීන් විසින් දැරිය යුතු බව ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශය විසින් තවදුරටත් දැනුම් දී ඇත. එසේ වුවද ප්‍රමාණයෙන් විශාල පරිත්‍යාගයන් ශ්‍රී ලංකාවට එවීමට අපේක්ෂා කරන අවස්ථාවකදී තානාපති කාර්යාලය හරහා කරනු ලබන ඉල්ලීමකට අනුව ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකන් ගුවන් සේවයේ සහාය ඇතිව ගාස්තු රහිතව එම පරිත්‍යාග ශ්‍රී ලංකාවට ප්‍රවාහනය කිරීම සඳහා මැදිහත් වීම් සිදු කිරීමේ හැකියාව පවතින අතර එම පරිත්‍යාග රාජ්‍ය තාන්ත්‍රික ගුවන් භාණ්ඩ නිදහස් කරන ආකාරයට කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපලින් නිදහස් කර ප්‍රවාහන පහසුකම් සැලසීමේ හැකියාව පවතින බවටද වැඩිදුරටත් දන්වා ඇත.

ඔබ විසින් ලබාදෙන පරිත්‍යාගයන් ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රෝහල්වල පවතින අවශ්‍යතාවය මත බෙදා හරිනු ලබන අතර ඒ පිළිබඳව පරිත්‍යාගශීලීන් දැනුවත් කිරීමටද සෞඛ්‍ය අමාතයාංශය විසින් කටයුතු කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් තානාපති කාර්යාලයේ පහත සඳහන් නිලධාරි මහතා අමතා ලබාගත හැක.

කේ. පී. චන්ද්‍රතිලක මහතා /පරිවාර නිළධාරි - 058 6875764

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව්/ඊශ්‍රායලය
2022/02/14

## Item Specification of SARS Cov-2 Rapid Ag Assay (ICT/ Lateral Flow Method).

| Item Specification |
|---|
| **Consists of;**<br>1. Immunochromatographic assays/ lateral flow device assay to detect SARS CoV-2 specific antigen using nasopharyngeal swab.<br>2. Test kit should have full registration at NMRA (should provide documented evidence).<br>3. WHO, CE IVD, FDA or equivocal emergency usage authorization for invitro diagnosis service (need to provide traceable documented evidence of such authorization).<br>4. Manufacturer leaflet should be available in English language with detailed testing procedure.<br>5. The test kit should have sensitivity more than 80% among samples with SARS CoV-2 PCR CT value up to 30.<br>6. Specificity of the test kit should be more than 97% compared to SARS CoV-2 PCR assay.<br>7. There should be manufacturer's valid certification with documented evidence that the test kit performance is the same across all SARS CoV-2 Variants of Concems detected to date (according to WHO classification) and regular updated performance checks against new variants should be conveyed to NMRA in writing.<br>8. The test kit should have its own sterile individually wrapped nasopharyngeal swab, test device, buffer/medium and needed other reagents/ consumables/ tubes/ dropper to perform the test as a point of care test or field test.<br>9. Results should be available within 15- 30 minutes time.<br>10. Kit should have appropriate biosafety features for testing procedure and ultimate discard of the used material.<br>11. Should have authorization letter from the manufacturer to the local agent. |